# ශ්‍රී ලංකාවේ පොත්ගුල් සම්ප්‍රදාය බිහිවීමට හා වර්ධනය වීමට තුඩුදුන් හේතුන් පිළිබඳ විමර්ශනයක්

**ආර්. එච්. අයි. එස්. රණසිංහ**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයනාංශය
කැලණිය විශ්ව විද්‍යාලය

ලේඛන සම්ප්‍රදායේ ආරම්භයෙන් පසුව මෙරට ඇතිවූ ග්‍රන්ථකරණය පොත්ගුල් ඉතිහාසය හැදෑරීමේ දී ඉතා වැදගත් වේ. මෙලෙස ඇරඹි ග්‍රන්ථ සම්ප්‍රදාය ආරක්‍ෂා කිරීමට ගත් පරිශ්‍රමය පොත් ගුල් සම්ප්‍රදාය බිහිවීමට පාදක වූ බව පෙනේ.

මෙරට ග්‍රන්ථකරණය පිළිබඳව තොරතුරු ලැබෙනුයේ ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසේ දී බුදු දහම හඳුන්වා දීමෙන් පසුවය. බුදු දහමින් පෝෂිත ආගමික හා සාහිත්‍ය ප්‍රබෝධයත් සමඟ අනුරාධපුර යුගයේ සිංහල, පාලි හා සංස්කෘත භාෂා වලින් ග්‍රන්ථ සම්භාරයක් ලියැ වී ඇත. මෙම ග්‍රන්ථ සම්භාරය බිහිවීමට සහ වර්ධනය වීමට තුඩුදුන් හේතුන් මෙහි දී සලකා බැලේ.

## ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම

ක්‍රිස්තුපූර්ව පළමුවන සියවසේ දී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම මෙරට ඉතිහාසයෙහි අළුත් පරිච්ඡේදයක් ආරම්භ වීමට හේතුවිය. මෙම සිදුවීම බෞද්ධ සාහිත්‍යයේ බිහිවීමට සහ පොත්ගුල් සම්ප්‍රදායේ ආරම්භයට පදනම ලෙස සැලකිය හැකිය.

ක්‍රිස්තුපූර්ව දෙවන සියවසෙහි මිහිඳු මාහිමි මෙරටට හඳුන්වා දුන් ත්‍රිපිටක ධර්මය සහ එහි අටුවා කථා මෙරට භික්‍ෂූන් විසින් සියවස් තුනක් පමණ මුඛ වචනයෙන් ගෙන එන ලදී. මහා ප්‍රඥා ඇති ඒ පෞරාණික භික්‍ෂූහු ත්‍රිපිටක පාලිය ද එහි අර්ථ කථාවන් ද මුඛ පාඨයෙන් ගෙනා බව **මහාවංසයෙහි** සඳහන් වේ.[1] ක්‍රිස්තු පූර්ව පළමුවන සියවස වන විට තවදුරටත් මුඛ වචනයෙන් පවත්වා ගැනීමට නොහැකි තත්ත්වයන් උද්ගත විය. මෙරට විදේශීය ආක්‍රමණ වලට ගොදුරු වීම,[2] බ්‍රාහ්මණතිස්ස සාගතය ඇතිවීම,[3] මහා විහාරයෙන් වෙන්වුණු නිකායක් අභයගිරියෙන් බිහිවීම,[4] ආදී හේතුන් නිසා ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමේ අවශ්‍යතාවය ඇතිවුනි.[5] අප සතුව පවත්නා ප්‍රධාන වංශ කථාවන් දෙක වූ **මහාවංසය** හා **දීපවංසය** එයට ප්‍රධාන හේතුව ලෙස,

"එකල් වැසිවූ භික්‍ෂූහු සත්වයන්ගේ පරිහානිය දැක....."[6]

"පණ්ඩිත භික්ෂූහු අනාගතයෙහි පණ්ඩිත බහුශ්‍රැතයන්ගේ අභාවය දැක....."[7]

සත්වයාගේ පරිහාණිය දක්වයි. මෙම පරිහානියට ඉතා සඳහන් කළ කරුණු හේතුවන්නට ඇති බව නිගමනය කළ හැකිය.

මෙම කරුණු නිසා වළගම්බා රාජ්‍ය සමයේ (ක්‍රිස්තු පූර්ව 49) දී මාතලේ ප්‍රාදේශීය ජනනායකයෙකුගේ ප්‍රධානත්වයෙන් අළුවිහාරයට රැස් වූ භික්‍ෂූන් එහි පැවැත්වූ සතරවන ධර්ම සංගායනාවෙන් පසු ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කර ඇත.[8] අප සතුව පවත්නා ඓතිහාසික ග්‍රන්ථ මූලාශ්‍රයන් සියල්ලෙහිම මෙන් මෙම සිදුවීම සමානව දක්වා ඇත්තේ එය අද්විතීය කාර්යයක් වූ හෙයිනි.

මෙම මහා කර්තව්‍යය කර ඇත්තේ ජන ප්‍රධානියෙකුගේ ආරක්‍ෂාව මැද බව නිකාය සංග්‍රහය, පූජාවලිය සහ රාජ රත්නාකරයෙහි සඳහන් වේ. මෙයින් නිගමනය කළ හැක්කේ වළගම්බා රජුගේ අනුග්‍රහය මේ සඳහා නොලැබුණ බවයි.

මහාවංසයෙහි සහ දීපවංසයෙහි සඳහන් වන්නේ ත්‍රිපිටකය "පොත්හි ලියවූහ" යනුවෙනි. මෙයින් අදහස් වනුයේ ත්‍රිපිටකය පොත්වල ලියන ලද බවයි. මේවා පුස්කොළ පොත් විය හැකිය. මුලින් ම ත්‍රිපිටකය රන්පත්වල ලියා අළු විහාරයේ ගුලක නිධන් කළ බව ජනප්‍රවාදයේ ඇතත් එය සනාථ වන සාධක මෙතෙක් හමු වී නොමැත.[9]

අළුවිහාරයේ සංස්කරණයේ අත් පිටපත් සහසා අළුවිහාරයේ, මහා විහාරයේ සහ දිවයිනේ අනිකුත් ප්‍රධාන විහාරයන්හි තැන්පත් කර ඇත. පසුකාලයේ දී මේ ග්‍රන්ථ කාණ්ඩ වශයෙන් පිටපත් කර දිවයිනේ විවිධ ස්ථානයන්හි පිහිටි ප්‍රධාන විහාරාරාමයන්ට බෙදාහැර ඇත.[10]

ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම ග්‍රන්ථ සම්භාරයක් බිහිවීමට හේතුවිය. පසුකාලයේ දී ත්‍රිපිටකය සම්බන්ධ අටුවා පොත් රාශියක් ද රචනා විය. ත්‍රිපිටක පිටපත් සහ ඒ පිළිබඳව ලියැවුණු ග්‍රන්ථ සම්භාරය තැන්පත්වීම මෙරට පොත්ගුල් වර්ධනය වීමේ මූලාරම්භය ලෙස සැලකිය හැක.